# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව -2010

## 01. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1:1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1:2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1:2:1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව රු.508,648 ක් වූ වන්දි ගෙවීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ප්‍රකාරව, අත්තිකාරම් ගෙවීමක් ලෙස දක්වා තිබූ රු. 379,500 ක් වටිනා තොග පද්ධතිය සඳහාවූ මෘදුකාංග ප්‍රාග්ධනගත කර සහ ක්‍රමක්ෂය කර නොතිබුණි.

#### 1:2:2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.3,165,993,388 ක් වූ මුළු ලැබිය යුතු ගිණුම් ශේෂවලින් රු.1,458,670,864 ක් හෙවත් 46.07% ක් පමණක් 2011 අප්‍රේල් 21 දින දක්වා අදාල ණනුදෙනුකරුවන් විසින් සනාථ කර තිබුණි.

(ආ) එකතුව රු.2,837,653,204 ක් වූ මුළු ගෙවිය යුතු ගිණුම් ශේෂයන්ගෙන් රු.1,646,232,961 ක් හෙවත් 58 % ක් පමණක් 2011 අප්‍රේල් 21 දක්වා අදාල පාර්ශවයන් විසින් සනාථ කර තිබුණි.

(ඇ) 2010 ජනවාරි සිට නොවැම්බර් දක්වා විවිධ ආයතන වලට හා බැංකුවේ නිලධාරීන්ට ගෙවූ එකතුව රු.50,000 ක් වූ අත්තිකාරම් 2011 අප්‍රේල් 25 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) රජයට ගෙවිය යුතු රු.134,321,918 ක් වූ උපචිත පොලී දිගු කාලයක සිට නිරවුල් නොවී පැවතුණි.

1:2:3 <u>නොසැසඳු වෙනස්කම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම වත්කම් සහ ජංගම වගකීම් යටතේ දක්වා ඇති පිළිවෙලින් රු.8,561,853 ක් හා රු.4,874,419 ක් වූ ශේෂ 2004 සිට සැසඳීමකින් තොරව පැවතුනි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ උපලේඛනයට අනුව 2010 දෙසැම්බර් 31 දිනට පවරාගත් දේපල ශේෂය රු. 23,685,030 ක් වුවත් බැංකුවේ අයකර ගැනීමේ අංශය ඉදිරිපත් කල උපලේඛනයට අනුව එය රු. 26,667,062 ක් ලෙස පෙන්නම් කෙරුනු බැවින් වෙනස රු. 2,982,032 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පමාකල බදු ගණනය සඳහා වූ ක්ෂය කිරීම් සම්බන්ධව පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| <u>ස්ථාවර වත්කම් ක්ෂය</u> | රු. |
|---|---|
| 2010 වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන අනුව | 12,109,631 |
| විලම්බිත බදු ගණනය කිරීම් අනුව | 9,788,170 |
| වෙනස | 2,321,461 |

1.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒ එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| <u>විෂයය</u> | <u>වටිනාකම</u> රු. | <u>නොලද සාක්ෂි</u> |
|---|---|---|
| (i) ගලදාරි හෝටලයේ පැවති සමුළුවක් සඳහාවූ වියදම | 164,600 | වැඩ සටහන් විස්තර, සහභාගි වූ අයගේ ලයිස්තුව |
| (ii) ප්‍රචාරණ නියෝජිතයන් මගින් සිදුකල ප්‍රචාරණ වියදම් | 1,400,364 | අදාල ප්‍රචාරණ නියෝජිතායතන සමග එළඹි ගිවිසුම් |
| (iii) වවුචර් 06 කට අදාල වියදම් | 1,172,298 | භාරගත් බවට ඇත්වීම් |
| (iv) මාතර දිස්ත්‍රික් ලේකම්, වෙනුවෙන්වූ "ව්‍යවසායකත්ව පුබුදුව " වැඩසටහන සඳහා ගෙවීම් | 500,000 | වැඩ සටහන් විස්තර හා ඉන්වොයිසි |

1:2:5 **නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 ඔක්තෝබර් 5 දිනැති අංක 06 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ මිලදී ගැනීම් මාර්ගෝපදේශ සංග්‍රහය | (i) තරඟකාරී මිල කැඳවීමකින් සහ ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාගැනීමකින් තොරව ප්‍රචාරණ වියදම් සඳහා රු. 2,642,104 ක් ගෙවා තිබුණි.<br>(ii) මිල කැඳවීමකින් සහ ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාගැනීමකින් තොරව විවිධ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. 4,317,765 ක් ගෙවා තිබුණි.<br>(iii) රු. 100,000 කට වැඩි වාහන අළුත්වැඩියා පිරිවැය අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය මත පමණක් සිදුකල යුතු වුවත්, බැංකුව විසින් සිදුකර තිබූ රු. 303,257 ක් වටිනා වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ.341 | අම්බලන්තොට බැංකු ශාඛාවේ උප පත්‍රිකා පොත් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) මු.රෙ.395 (සී ) . | මාතර බැංකු ශාඛාව 2010 ජූනි සිට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| | (iii) මු.රෙ.454 සහ 751 | අම්බලන්තොට හා මාතර ශාඛා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබුණි. |

(iv) මු.රෙ.756 සහ 757 — සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා පිටපත් නියමකර ඇති පරිදි විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය බදු වලට පෙර රු.මිලියන 642.24 ක ශුද්ධ ලාභයක් වූ අතර, එය ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ ලාභය වූ රු.මිලියන 119.93 සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 522.31 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵල වැඩිවී තිබුණි. අනෙකුත් ඉකුත් වර්ෂ 04 හි එහි පිරිහීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කෙරුණි. විස්තර පහත පරදි වේ.

| | | 2010<br>රු.<br>(මිලියන) | 2009<br>රු.<br>(මිලියන) | 2008<br>රු.<br>(මිලියන) | 2007<br>රු.<br>(මිලියන) | 2006<br>රු.<br>(මිලියන) | 2005<br>රු.<br>(මිලියන) |
|---|---|---|---|---|---|---|---|
| (i) | පොලී ආදායම | 2,362 | 2,165 | 1,956 | 1,399 | 1,307 | 1,168 |
| (ii) | පොලි වියදම | 1,368 | 1,939 | 1,636 | 1,002 | 608 | 468 |
| (iii) | ශුද්ධ පොලි ආදායම | 994 | 226 | 320 | 397 | 699 | 700 |
| (iv) | වෙනත් මෙහෙයුම් ආදායම් | 387 | 505 | 261 | 170 | 117 | 71 |
| (v) | වෙනත් ආදායම | 1 | 2 | 5 | 2 | 1 | 1 |
| (vi) | මුළු ආදායම | 1,382 | 733 | 586 | 569 | 817 | 773 |
| (vii) | මුළු පුනරාවර්ථන වියදම් | 740 | 613 | 535 | 445 | 499 | 358 |
| (viii) | බදු වලට පෙර ශුද්ධ ලාභය | 642 | 120 | 51 | 124 | 318 | 415 |
| (ix) | බදු | 178 | 46 | 30 | 41 | 105 | 102 |
| (x) | බදු වලට පසු ශුද්ධ ලාභය | 463 | 74 | 21 | 83 | 213 | 312 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 - 2009 කාලපරිච්ඡේදය තුළ පොලී ආදායම රු.මිලියන 1,168 සිට රු.මිලියන 2,362 දක්වා එනම් 102.23% කින් වැඩි වී තිබුණු අතර, පොලී වියදම් ඉහළ අනුපාතයකින් එනම් රු.මිලියන 468 සිට රු.මිලියන 1,939 දක්වා එනම් 314.32% කින් වැඩි වී එය 2010 වර්ෂයේදී රු.මිලියන 1,368 දක්වා එනම් 29.7% අඩුවී තිබුණි.

(ආ) යථෝක්ත කාලපරිච්ඡේදය තුළ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 415 සිට රු.මිලියන 642 දක්වා එනම් 54.7% කින් වැඩිවී තිබුණු අතර බදු පසු ශුද්ධ ලාභය රු.මිලියන 312 සිට රු.මිලියන 463 දක්වා එනම් 48.4% කින් වැඩි වී තිබුණි.

## 2:2 අනුපාත සහ ප්‍රතිශත

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක බැංකුවේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි විය.

| | | 2010 | 2009 | 2008 | 2007 | 2006 | 2005 |
|---|---|---|---|---|---|---|---|
| | | % | % | % | % | % | % |
| (අ) | ලාභදායීත්ව අනුපාත | | | | | | |
| | i ශුද්ධ පොලී ආන්තිකය | 7.67 | 4.41 | 4.16 | 4.85 | 7.98 | 7.3 |
| | ii ස්කන්ධය මත ප්‍රතිලාභ | 17.47 | 3.10 | 1.76 | 3.3 | 8.56 | 14 |
| | iii සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 3.57 | 0.72 | 0.38 | 1.1 | 3.11 | 4 |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය | | | | | | |
| | i ස්කන්ධය /මුළු වත්කම් | 14.62 | 13.28 | 16.01 | 19.9 | 23.5 | 26 |
| | ii ස්කන්ධය /ණය | 19 | 18 | 19 | 23 | 26 | 28 |
| | iii පළමු පෙළ (Tier - I) - මූලික ප්‍රාග්ධනය | 26.15 | 25.29 | 27.81 | 56.95 | 76.15 | 87 |
| | iv මුළු දෙවන පෙළ (Tier - II) ප්‍රාග්ධනය | 26.89 | 25.29 | 28.47 | 57.98 | 77.38 | 89 |
| (ඇ) | ද්‍රවශීල වත්කම් | | | | | | |
| | i ද්‍රවශීල වත්කම් /තැන්පතු (වගකීම්) | 21 | 26 | 12 | 10 | 10 | 12 |
| | ii තැන්පතු/ණය සහ අත්තිකාරම් | 85 | 85 | 71 | 61 | 51 | 54 |
| | iii ණය ගැනීම්/ණය සහ අත්තිකාරම් | 4 | 5 | 5 | 10 | 13 | 13 |

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ද්‍රවශීල වත්කම් සඳහා හැර අනුපාත හා ප්‍රතිශතයන් වැඩිවී තිබුණි.

2:3 <u>ණය පරිපාලනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2:3:1 <u>උකස් ණය, සේවක අර්ථසාධක අරමුදල් ණය හා වතු අංශයේ සේවක අර්ථසාධක අරමුදල් ණය ප්‍රදානයන් පිළිබඳ තත්ත්වය.</u>

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ උකස් ණය, සේවක අර්ථසාධක අරමුදල් ණය හා වතු අංශයේ සේවක අර්ථසාධක අරමුදල් ණය ප්‍රදානයන් පිළිබඳ තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2010 | | 2009 | | විචලනය | |
|---|---|---|---|---|---|---|
| | ගිණුම් සංඛ්‍යාව | වටිනාකම රු.මිලියන | ගිණුම් සංඛ්‍යාව | වටිනාකම රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| උකස් ණය | 1,164 | 499 | 1,652 | 523 | (24) | (4.6) |
| සේ. අ. අ.ණය | 5,082 | 1,124 | 3,851 | 692 | 432 | 62.4 |
| වතු අංශයේ සේ.අ. අ.ණය | 1,771 | 96 | 2,511 | 130 | (34) | (26.1) |
| එකතුව | 8,017 | 1,719 | 8,014 | 1,345 | 374 | 27.8 |

සමාලෝචිත වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදල් ණය රු.මිලියන 1,124 ක් වූ අතර ඉකුත් වර්ෂයේ රු.මිලියන 692 හා සැසඳීමේදී රු.මිලියන 432 ක් හෙවත් 62.4% කින් වැඩිවීමක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2010 වර්ෂයේදී උකස් ණය සහ වතු අංශයෙ සේවක අර්ථසාධක අරමුදල් ණය පිළිවෙලින රු.මිලියන 24 කින සහ රු.මිලියන 34 කින හෙවත 4.6% කින හා 26.1% කින අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

2.3.2 <u>ණය පිළිබඳ කාල විශ්ලේෂණය</u>

සපයන ලද තොරතුරු අනුව, 2010 දෙසැම්බර් 31 දිනට උකස් ණය, සේවක අර්ථසාධක අරමුදල් ණය සහ වතු අංශයෙ සේවක අර්ථසාධක අරමුදල් ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් පහත ප්‍රකාශයෙන දැක්වේ.

2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂය

| කාල පරිච්ඡේදය මාසවලින් | උකස් ණය රු. මිලියන | සේවක අර්ථසාධක අරමුදල් ණය රු. මිලියන | වතු අංශයෙ සේවක අර්ථසාධක අරමුදල් ණය රු. මිලියන |
|---|---|---|---|
| 0 | 3,781 | 1,454 | 158 |
| 1 - 2 | 2,144 | 524 | 36 |
| 3 - 5 | 437 | 345 | 152 |
| 6 - 11 | 134 | 581 | 163 |
| 12 - 17 | 34 | 2,802 | 326 |
| 18 සහ ඊට වැඩි | 47 | 108 | 6 |
| එකතුව | 6,577 | 5,814 | 841 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සේවක අර්ථසාධක අරමුදල් ණය වලට අදාළව හිඟව පවතින රු. මිලියන 5,814 ක මුළු ණය ශේෂයෙන් රු. මිලියන 2,910 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(ii) වතු අංශයෙ සේවක අර්ථසාධක අරමුදල් ණය වලට අදාළව හිඟව පවතින රු. මිලියන 841 ක මුළු ණය ශේෂයෙන් රු. මිලියන 332 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(iii) සේවක අර්ථසාධක අරමුදල් ණය සහ වතු අංශයේ ණය වලට අදාළව හිඟව පවතින ණය ශේෂ අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගත් බවට සාක්ෂි නොවීය.

### 2.3.3 මුළු ණය, අක්‍රීය ණය සහ අක්‍රීය ණය අනුපාත

ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහාවූ හිඟව පවතින මුළු ණය, අක්‍රිය ණය හා අක්‍රීය ණය අනුපාත ඉකුත් වර්ෂ හතර සමඟ සසඳා පහත දැක්වේ.

(අ) සක්‍රිය ණය

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| උකස් | 6,577 | 7,016 | 7,192 | 6,194 | 5,407 |
| සේ. අ. අ.ණය | 5,814 | 5,225 | 4,931 | 3,984 | 3,389 |
| වතු අංශයේ සේ.අ. අ.ණය | 841 | 798 | 715 | 663 | 623 |
| එකතුව | 13,232 | 13,039 | 12,838 | 10,841 | 7,419 |

(ආ) අක්‍රීය ණය

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| උකස් | 653 | 1,278 | 917 | 866 | 1,058 |
| සේ. අ. අ.ණය | 3,836 | 3,714 | 2,898 | 2,235 | 1,979 |
| වතු අංශයේ සේ.අ. අ.ණය | 647 | 618 | 456 | 471 | 356 |
| එකතුව | 5,136 | 5,610 | 4,271 | 3,572 | 3,393 |

(ඇ) අක්‍රීය ණය අනුපාත (%)

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| උකස් | 9.93 | 18.21 | 12.75 | 13.98 | 19.57 |
| සේ. අ. අ.ණය | 65.98 | 71.08 | 58.77 | 56.10 | 58.39 |
| වතු අංශයේ සේ.අ. අ.ණය | 76.93 | 77.44 | 63.78 | 71.04 | 57.14 |
| එකතුව | 38.81 | 43.02 | 33.27 | 32.95 | 45.73 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත ප්‍රකාශය අනුව පිළිවෙලින් උකස් ණය, සේවක අර්ථසාධක අරමුදල් ණය සහ වතු සේවක අර්ථසාධක අරමුදල් ණය සම්බන්ධ අක්‍රීය ණය අනුපාතය 9.93% ක් 65.98% ක් සහ 76.93% ක් විය.

(ii) 2006 සිට 2010 දක්වා සේවක අර්ථසාධක අරමුදල් ණය වලට අදාලව 58.39% සිට 65.98% දක්වා සහ වතු අංශයේ ාස්වක අර්ථසාධක අරමුදල් ණය වලට අදාලව 57.14% සිට 76.93% දක්වා අක්‍රීය ණය අනුපාත වැඩි වී තිබුණි.

(iii) මුළු අක්‍රීය ණය 2006 වර්ෂයේ රු.මිලියන 3,393 සිට 2009 වර්ෂයේ රු.මිලියන 5,610 ක් දක්වා රු.මිලියන 2,217 කින් වැඩිවී තබු අතර මුළු අක්‍රීය ණය 2009 වර්ෂයේ රු.5,610 සිට 2010 වර්ෂයේ රු.මිලියන 5,136 ක් දක්වා රු.මිලියන 474 කින් අඩුවී තිබුණි.

(iv) සේවක අර්ථසාධක අරමුදල් ණය සම්බන්ධ අක්‍රීය ණය 2006 වර්ෂයේ රු.මිලියන 1,979 සිට 2010 වර්ෂයේ රු.මිලියන 3,836 දක්වා රු.මිලියන 2,157 කින් වැඩිවී තිබුණු අතර වතු අංශයේ සේවක අර්ථසාධක අරමුදල් ණය සම්බන්ධ අක්‍රීය ණය 2006 වර්ෂයේ රු.මිලියන 356 සිට 2010 වර්ෂයේ රු.මිලියන 647 දක්වා රු.මිලියන 291 කින් වැඩිවී තිබුණි.

(v) උකස් ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් බොහෝ දුර්වලතා විගණන තියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(අ) 1984 සිට 1996 දක්වා ප්‍රදානය කළ එකතුව රු.552,000 ක් වූ ණය මුදල් 04 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දිගු ප්‍රමාදයක් පැවතුණි. 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ වල එකතුව රු.1,732,439 ක් විය.

(ආ) 1984 සිට 2008 දක්වා ප්‍රදානය කළ එකතුව රු.3,622,000 ක් වූ ණය මුදල් 08 ක් සම්බන්ධයෙන් වූ උකස් දේපල විකිණීමේ හෝ වෙන්දේසි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ දිගු ප්‍රමාදයක් පැවතුණි. 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ වල එකතුව රු.6,368,574 ක් විය.

(ඈ) 1995 සිට 2008 දක්වා ප්‍රදානය කළ එකතුව රු.10,125,000 ක් වූ ණය මුදල් 03 ක් සම්බන්ධයෙන් වූ දේපළ තක්සේරු කිරීමේ ප්‍රශ්නකාරී තත්ත්වයන් පැවතුනි. 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ වල එකතුව රු.15,658,988 ක් විය.

(ඈ) 1995 සිට 1996 දක්වා ප්‍රදානය කළ එකතුව රු.325,000 ක් වූ ණය මුදල් 02 ක් සම්බන්ධයෙන් වූ උකස් දේපළ යෝග්‍ය තත්ත්වයක නොපැවතුනි. 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ වල එකතුව රු.1,259,208 ක් විය.

(ඉ) 1984 සිට 1996 දක්වා ප්‍රදානය කළ එකතුව රු.392,000 ක් වූ ණය මුදල් 03 ක් සම්බන්ධයෙන් ණය දුන් පාර්ශවයන්ට සිහි කැඳවීම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට උගු ප්‍රමාදයක් පැවතුනි. 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ වල එකතුව රු.1,317,197 ක් විය.

## 2:4 උකස් ණය සම්බන්ධයෙන් පවරාගත් දේපළ

සපයා තිබූ තොරතුරු අනුව පවරා ගත් දේපළ 131 ක් සම්බන්ධයෙන් හිඟව පැවති ණය ශේෂයෙහි මුල් මුදල වූ රු.26,667,062 ක මුදලක් හා ලැබියයුතු මුළු වටිනාකම වූ රු.54,807,912 ක මුදලක් 2010 දෙසැම්බර් 31 දිනට බැංකුවට ලැබියයුතු මුදලක් ලෙස දක්වා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂය වන විටත් ඇතැම් පවරාගත් දේපළ වලට අදාලව හිඟව පැවති ණය ශේෂ අපහරනය කිරීමට හා අයකර ගැනීමට ඉක්මන් හා ඵලදායී ක්‍රියාමාර්ග ගත් බවට සාක්ෂි නොවීය. සමාලෝචිත වර්ෂය තුළදී දේපළ 137 කින් වටිනාකම රු.548,243 (BPO) ක් වූ දේපළ 06 ක් බැංකුව විසින් අපහරනය කර තිබුණි.

(ii) පහත සදහන් හේතූන් නිසා පවරාගත් බොහෝ දේපළ විකිණිය නොහැකි විය.

(අ) හිඟව පැවති ණය ශේෂ, උපචිත පොලී හා අනෙකුත් වියදම්, උකසට තබාතිබූ දේපළවල වටිනාකම ඉක්මවා තිබීම නිසා එවැනි ඉහළ මිලකට එම දේපළ විකිණිය නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. පවරාගත් දේපළ 06 කින් රු.1,272,076 ක ශුද්ධ පාඩුවක් සිදුවී තිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය.

(ආ) හිමිකාරත්වය නොතිබීම, දේපළ ආරක්ෂණ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම සහ අවිධිවත් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය පවරාගත් දේපළ විකිණීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

## 2:5 මානව සම්පත් කළමනාකරණය

ලබාගතහැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සදහා වූ අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු තත්ත්වයන් ඉකුත් වර්ෂ දෙක සමග සසදා පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගීකරණය | අනුමත කාර්ය මණ්ඩලය | | | තථ්‍ය කාර්ය මණ්ඩලය | | | පුරප්පාඩු තත්ත්වයන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 දෙසැම්බර් 31 දිනට | 2009 දෙසැම්බර් 31 දිනට | 2010 දෙසැම්බර් 31 දිනට | 2008 දෙසැම්බර් 31 දිනට | 2009 දෙසැම්බර් 31 දිනට | 2010 දෙසැම්බර් 31 දිනට | 2008 දෙසැම්බර් 31 දිනට | 2009 දෙසැම්බර් 31 දිනට | 2010 දෙසැම්බර් 31 දිනට |
| විධායක | 183 | 183 | 183 | 161 | 167 | 159 | 22 | 16 | 24 |
| විධායක නොවන කළමනාකරණ | 150 | 150 | 150 | 125 | 116 | 114 | 25 | 34 | 36 |
| පුහුණුවන්නන් | 15 | 15 | 15 | - | - | - | 15 | 15 | 15 |
| සුළු සේවකයන් | 53 | 53 | 53 | 42 | 35 | 34 | 11 | 18 | 19 |
| අනියම් | - | - | - | - | 02 | 01 | - | (02) අතිරික්ත | (01) අතිරික්ත |
| එකතුව | 401 | 401 | 401 | 328 | 320 | 308 | 73 | 81 | 93 |

2:6 **<u>හඳුනාගත් පාඩු</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණයක් සඳහා උකසට තබා තිබූ දේපළක් සමුද්‍ර බාදනය වීම හේතුවෙන් ලැබිය යුතුව තිබූ රු.748,908 ක මුදලක් ලියාහැර තිබුණි.

(ආ) සපයන ලද තොරතුරු අනුව පවරාගත් දේපළ බැහැර කිරීමේදී එකතුව රු.245,818 ක් වූ පාඩු දැරීමට සිදුවී තිබුණි.

2:7 **<u>හඳුනා නොගත් ගනුදෙනු</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිණුම් පිළිබඳ අදාල නොවන ශේෂ 2008 වර්ෂයේ සිට අනුක්‍රමයෙන් වැඩිවී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | ගිණුම් වල දැක්වෙන වටිනාකම |
|---|---|
| | රු. |
| 2008 | 140,275,275 |
| 2009 | 163,649,853 |
| 2010 | 227,267,479 |

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.6,829,468 ක් වූ තැන්පතු අදාල තැන්පත් කරුවන්ට බැර කර නොතිබුණි.

2010 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් තැන්පතු පිළිබඳ කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | ගිණුම් වල දැක්වෙන වටිනාකම |
|---|---|
| | රු. |
| 2004 | 5,767,325 |
| 2005 | 7,654,648 |
| 2006 | 11,022,769 |
| 2007 | 12,339,334 |
| 2008 | 8,189,152 |
| 2009 | 7,262,062 |
| 2010 | 6,829,468 |

ඉහත විස්තර වලට අනුව හදුනා නොගත් තැන්පතු 2004 සිට 2007 දක්වා වූ වර්ෂ හතර සදහා රු.5,767,325 සිට රු.12,339,334 දක්වා අනුක්‍රමයෙන් වැඩිවී තිබුණි. කෙසේ වුවද 2008 දෙසැම්බර් 31 දිනට, 2009 දෙසැම්බර් 31 දිනට සහ 2010 දෙසැම්බර් 31 දිනට හදුනා නොගත් තැන්පතු ශේෂවල පහත වැටීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කර තිබුණි.

## 2:8 අධිකාරී බලය නොලත් ගනුදෙනු

දෛනික බැංකු ජංගම ගිණුමක ශේෂයෙහි උපරිම සීමාව වන රු.2,000,000 අවස්ථා කිහිපයකදී බැංකු ශාඛාව විසින් පහත පරිදි ඉක්මවා තිබුණි.

| දිනය | රදවාගත් ශේෂය | ඉක්මවූ මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 2010 මැයි 04 | 2,557,776 | 557,776 |
| 2010 ජූලි 01 | 3,141,548 | 1,141,548 |
| 2010 ජූලි 05 | 3,794,493 | 1,794,493 |
| 2010 ජූලි 07 | 2,859,535 | 859,535 |
| 2010 ජූලි 26 | 2,624,846 | 624,846 |

## 2:9 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **අභ්‍යන්තර විගණන ප්‍රමිත සහ ආචාර ධර්ම විධි සංග්‍රහය**

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2009 ඔක්තෝබර් 07 දිනැති අංක ඩීඑම්ඒ/2009(3) දරන චකලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය හා වාර්ෂික විගණන වැඩසටහන් බැංකුව විසින් සැලසුම් කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කිරීමේදී පහත දැක්වෙන අභ්‍යන්තර විගණන ප්‍රමිත උපයෝගී කරගෙන නොතිබුණි.

(i) ඇමුණුම - 2- කාර්ය සාධන ප්‍රමිත - අංක 2110 - අවදානම් කළමනාකරණය

(ii) ඇමුණුම - 2- කාර්ය සාධන ප්‍රමිත - අංක 2110 - සැලසුම් කළමනාකරණය

(ආ) **2010 වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහන**

සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහනෙහි බැංකු කටයුතු සම්බන්ධයෙන් අතිශය වැදගත් වූ පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් ආවරණය වී නොතිබුණි.

(i) සමාලෝචනය හා අගය කිරීම සම්බන්ධව :-

- කාර්තුමය හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන
- 2010 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ 2010 - 2012 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- බැංකුවේ සමස්ථ කාර්ය සාධනය
- බැංකුවේ අවදානම් කළමනාකරණය
- බැංකුවේ මුදල් ප්‍රවාහ කළමනාකරණය
- මානව සම්පත් කළමනාකරණය විශේෂයෙන් බඳවා ගැනීම්, උසස් කිරීම් ප්‍රගතය, සේවක මණ්ඩල පරිපාලන ප්‍රගතියට අදාල කටයුතු
- ප්‍රචාරණ වියදම්

(ii) ඉන්වෙන්ට්‍රි ලේඛණ භෞතික වත්කම් සමග පරීක්ෂා කිරීම

(iii) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විගණන විමසුම් සමාලෝචනය කිරීම සහ ඒවාට කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය දැක්වීම.

(iv) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය.

(ඇ) 2010 වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි ඇතුලත් කර තිබූ පහත සඳහන් කටයුතු ඉටුකර නොතිබුණි.

(i) හිඟ සහ හිඟව පවතින ණය අයකර ගැනීම.

(ii) ප්‍රධාන කාර්යාලයේ සහ පිටපළාත් වල ශාඛාවන්හී නොසැසඳු ගිණුම් සහ හඳුනා නොගත් තැන්පතු

(iii) ප්‍රසම්පාදනය

(iv) දේපළ තක්සේරු කිරීම

(v) පොදුකාර්ය වියදම්

(vi) ශාඛා 08 ක් ආවරනය කිරීම සඳහා ඇතුලත් කර තිබූ අභ්‍යන්තර විගණනයෙන් එක් පිට පළාතක ශාඛා විගණනයකට අදාලව පමණක් කටයුතු සිදුකර තිබුණි.

## 2:10 <u>සංයුක්ත සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය.</u>

2010 - 2012 දක්වා වූ සංයුක්ත සැලැස්මේ සහ 2010 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ හා අයවැය ලේඛනයේ දක්වා තිබූ ඉලක්ක කිහිපයක් සපුරා ගෙන නොතිබුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා බැංකුවේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) දේපළ පවරා ගැනීම්
(ආ) හිඟ ණය ශේෂ
(ඇ) ගිණුම්කරණය
(ඈ) අභ්‍යන්තර විගණනය
(ඉ) පාලන ගිණුම් සැසඳීම
(ඊ) අන්තිකාරම් නිරවුල් කිරීම
(උ) ශේෂ සනාථ කිරීම්
(ඌ) නීති රීති සහ රෙගුලාසි වලට අනුකූලවීම